(අන්තර්ජාල අනුවාදයකි.)

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1999 අංක 15 දරන බේරුවල මාලේවන ශ්‍රී ඥානිස්සර ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ පාලක සභාව (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ **1999** ජූනි මස **15** වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1999 ජූනි මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 4.50 යි. තැපැල් ගාස්තුව : රු. **3.50** යි.

**1999 අංක 15 දරන බේරුවල මාලේවන ශ්‍රී ඥාණිස්සර ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ පාලක සභාව (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 1999 ජූනි මස 15 වැනි දින.]

එල්. ඩී.–ඕ. 80/95.

## බේරුවල මාලේවන ශ්‍රී ඥාණිස්සර ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ පාලක සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"බේරුවල මාලේවන ශ්‍රී ඥාණිස්සර ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයට සම්බන්ධ සියලු පරමාර්ථ හා දේ එහි සාමාජිකයන් විසින් එකඟ වූ රීතිවලට අනුකූලව සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමේ හා ඉටු කිරීමේ කාර්ය සඳහා "බේරුවල මාලේවන ශ්‍රී ඥාණිස්සර ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය " යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන විද්‍යාලයක් ශ්‍රී ලංකාවේ මෙතෙක් පිහිටුවා තිබූ හෙයින් ද ; පූර්විකාව.

එකී විද්‍යාලයේ කටයුතු සහ පරමාර්ථ මෙතෙක් පාලක සභාවක් විසින් කළමනාකරණය කර ඉටු කරනු ලැබූ හෙයින් ද ;

එකී පාලක සභාව සංස්ථාගත කිරීම සඳහා ඉල්ලුම් කර ඇති හෙයින් සහ එම ඉල්ලීම ප්‍රදානය කිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද ;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

**1**. මේ පනත 1999 අංක 15 දරන බේරුවල මාලේවන ශ්‍රී ඥාණිස්සර ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ පාලක සභාව (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2**. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "විද්‍යාලය" යනුවෙන් සඳහන් කරනු ලබන) බේරුවල මාලේවන ශ්‍රී ඥාණිස්සර ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ පාලක සභාවේ තත්කාලීන සාමාජිකයන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "බේරුවල මාලේවන ශ්‍රී ඥාණිස්සර ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ පාලක සභාව" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් බවට පත් විය යුතු අතර, එම සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණයන්හි නඩු පවරනු ලැබිය හැකි ය. තවද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. බේරුවල මාලේවන ශ්‍රී ඥාණිස්සර ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ පාලක සභාව සංස්ථාගත කිරීම.

H - 022545

සංස්ථාවේ පොදු පරමාර්ථ

**3**. සංස්ථාව, සංස්ථාපනය කරනු ලබන පොදු පරමාර්ථ පහත දැක්වෙන පරමාර්ථ බව මෙයින් ප්‍රකාශ කරනු ලබේ :–

(අ) පාරම්පරික ආයුර්වේද සහ ඒ ආශ්‍රිත වෛද්‍ය ක්‍රම ඉගැන්වීම සඳහා වූ ජාතික මධ්‍යස්ථානයක් වශයෙන් විද්‍යාලය පවත්වාගෙන යාම, නඩත්තු කිරීම සහ පරිපාලනය කිරීම ;

(ආ) පාරම්පරික ආයුර්වේද වෛද්‍ය ක්‍රමය පිළිබඳව ශිෂ්‍යයන් පුහුණු කිරීම සඳහා සහ රෝගීන්ට නොමිලේ ප්‍රතිකාර කිරීම සඳහා ආයුර්වේද රෝහලක් පිහිටුවීම ;

(ඇ) පාරම්පරික ආයුර්වේද වෛද්‍ය ක්‍රමයෙහි ප්‍රවීණත්වය ලබා ඇති තැනැත්තන් තීරණය කිරීමේ කාර්යය සඳහා ආයුර්වේද වෛද්‍ය සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(ඈ) විද්‍යාලය සඳහා අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම, නඩත්තු කිරීම සහ ඒවාට උපකරණ සැපයීම ;

(ඉ) විද්‍යාලයේ වර්ෂ හතරක අධ්‍යයන පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කරන තැනැත්තන්ට, ආයුර්වේද කොමසාරිස්වරයා විසින් පත් කරනු ලබන පරීක්ෂක මණ්ඩලයක් විසින් පවත්වනු ලබන පරීක්ෂණයකින් පසු ඇම්.ජී.ඒ.ඇස්. (මාලේවන ඤාණිස්සර ආයුර්වේද ශාස්ත්‍රී) සහතිකය ප්‍රදානය කිරීම ;

(ඊ) ආයුර්වේද වෛද්‍ය ක්‍රමයෙහි පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම, ධෛර්යමත් කිරීම සහ නංවාලීම ;

(උ) ශ්‍රී ලංකාවේ පාරම්පරික ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ ප්‍රවර්ධනය හා දියුණුව සඳහා වූ කටයුතුවල යෙදී සිටින තැනැත්තන්ට වාර්ෂිකව සම්මාන සහතික ප්‍රදානය කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම ආධාර මුදල් හා පරිත්‍යාග පිළිගැනීම හෝ එකතු කිරීම, සංස්ථාවේ මුදල් ආයෝජනය කිරීම, සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීම, සේවයේ

නියුක්ත කිරීම සහ සේවයෙන් නෙරපීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් ඉටුකර ගැනීම සඳහා සහ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා සහ දේ කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවලට තිබිය යුතුය.

සංස්ථාවේ රීති.

**5**. (1) සාමාජිකයන් තෝරා පත්කර ගැනීම සහ ඔවුන්ගේ ධුර කාලය, සංස්ථාවේ කටයුතු කළමනාකරණය හා එහි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමකදී පැමිණ සිටින සහ ඡන්දය දෙන සාමාජිකයන් තුනෙන් දෙකකට නොඅඩු වැඩි ඡන්ද ගණනකින් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නිත්‍යානුකූල විය යුතුය. එසේ සාදනු ලැබූ රීති එවැනිම රැස්වීමක දී ඒ ආකාරයට ම වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකිය.

(2) සංස්ථාවේ සාමාජිකයන් තත්කාලයේ සංස්ථාවේ බලපවත්වන රීතිවලට යටත් විය යුතුය.

විද්‍යාලයෙන් ගෙවිය යුතු සහ විද්‍යාලයට අයවිය යුතු ණය.

**6**. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති විද්‍යාලයේ සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට විද්‍යාලයට අයවිය යුතු සියලු ණය සහ ගෙවනු ලැබිය යුතු දායක මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතුය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**7**. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, බද්දක් හෝ අන්තිම කැමති පත්‍රයකින් දේපළ නීයාදනය කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් හෝ සංස්ථාව සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් සංස්ථාවේ තත් කාලයේ වලංගුව පවත්නා රීතිවලට යටත්ව ලබා ගැනීමට සහ දැරීමට නීතියෙහි ලා සංස්ථාවට හැකිවන සහ බලය ඇති අතර, ඒ දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන් ආකාරයකින් බැහැර කිරීමට පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතුය.

සංස්ථාවේ මුද්‍රාව.

**8**. සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති නිලධරයන් සංඛ්‍යාවක් ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කවර වූ හෝ සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතුය. එකී නිලධරයන් විසින් තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතුය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**9**. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් වෙතින් ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන්ගේ හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනයම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතුය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**10**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු.870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.